00013

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESU 3211 - අධ්‍යාපන මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.03.04 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

**I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. අධ්‍යාපන මනෝ විද්‍යාව යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමට අදාලව ගුරුවරයකු විසින් සලකා බැලිය යුතු අංශ තුනක් (03) නම් කරන්න.

03. ශිෂ්‍ය චර්යාව අධ්‍යයනය කිරීම සඳහා භාවිත කළ හැකි පර්යේෂණාත්මක සහ පර්යේෂණාත්මක නොවන ක්‍රම අතර පවතින වෙනස්කම් දෙකක් (02) සඳහන් කරන්න.

04. 'වර්ධනය' සහ 'සංවර්ධනය' අතර පවතින වෙනස්කම් සුදුසු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

05. 'පරිණතිය' සහ 'ඉගෙනුම' අතර පවතින අන්තර් සම්බන්ධතාවේ වැදගත්කම සාකච්ඡා කරන්න.

06. විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යායේ මූලධර්ම තුනක් (03) විස්තර කරන්න.

07. ශිෂ්‍යයන්ගේ ස්මරණය වැඩි දියුණු කිරීම සඳහා භාවිත කළ හැකි ශිල්පීය ක්‍රම තුනක් (03) සුදුසු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

08. පියාජේගේ සහ බෲනර්ගේ ප්‍රජානන සංවර්ධන න්‍යායන් අතර පවතින සමානතා තුනක් (03) සාකච්ඡා කරන්න.

**(ලකුණු 5 x 8 = 40)**

## II වන කොටස

09\. (i) ළමා සංවර්ධනයට බලපානු ලබන ආරමය සහ පරිසරාත්මක සාධකවල අන්තර් යැපීමේ ස්වභාවය (Nature of the interdependence) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පවුල සහ පාසල් පරිසර තත්ත්ව (Conditions) ළමයකුගේ සංවර්ධනය සඳහා වාසිදායක සහ අවාසිදායක වන ආකාරය සුදුසු නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (එකක් සඳහා තත්ත්ව දෙකක් (02) දක්වන්න.) (ලකුණු 08)

(iii) ගුරුවරයකු වශයෙන් ඔබ ඉහත දක්වන ලද අවාසිදායක පරිසර තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා ඔබගේ ශිෂ්‍යයන්ට සහය වන්නේ කෙසේ ද? (ලකුණු 06)

10\. (i) ළමා වියේ සහ නව යොවුන් වියේ වෙනස් චර්යාත්මක ලක්ෂණ පහක් (05) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) නව යොවුන් වියේදී පුද්ගලයකු විසින් මුහුණ දෙනු ලබන ගැටලු පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඉහත ගැටලු විසඳීමේ දී ගුරුවරයකුට උපකාර විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11\. (i) ඉගෙනුමට අදාළව 'පෙළඹීම' සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) පෙළඹවීම් ප්‍රවේශ තුනක් (3) නම් කර, ඉන් දෙකක ඉදිරිපත් කර ඇති මූලික සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව පෙළඹීම ඇති කිරීම සඳහා ගුරුවරයකුගේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 05)

12. (i) ඉගෙනුම් න්‍යාය කාණ්ඩ තුන(3) දක්වා එක් කාණ්ඩයකින් එක් න්‍යායක් බැගින් (න්‍යායන් 3 ක් ) සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් කළ න්‍යායන් තුනේ (3) මූලික මූලධර්ම පරීක්ෂා කරන්න. (ලකුණු 09)

(iii) ඉහත ප්‍රශ්නයෙන් (12 (ii)) න්‍යායන් දෙකක් තෝරාගෙන, එම න්‍යායයන් දෙකේ මූලධර්ම පන්ති කාමර අවස්ථාවලදී භාවිත කළ හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) 'පෞරුෂය' යන්න නිර්වචන දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පෞරුෂ සංවර්ධනය සඳහා බලපානු ලබන සාධක තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍යයන්ගේ පෞරුෂ සංවර්ධනය කරා ගුරුවරුන්ට උත්සාහ දැරිය හැක්කේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09)

14. පහත දැක්වෙන තේමාවලින් ඕනෑම තුනක් (03) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) නව යොවුන් වියේ සාමාජයීය සංවර්ධනය

(ii) සංවර්ධනාත්මක මනෝවිද්‍යාඥයින් විසින් අනුගමනය කළ ප්‍රධාන සංවර්ධන අවධි

(iii) ගුරුවරයකුට 'සුදානම' සංකල්පයේ ඇති වැදගත්කම

(iv) අනාවරණ ඉගෙනුමේදී ගුරුවරයාගේ භූමිකාව

(ලකුණු 6 x 3 +2 = 20)

\- හිමිකම් ඇවිරිණි. -

0001

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF EDUCATION DEGREE PROGRAMME**
**(NATURAL SCIENCE)**
**FINAL EXAMINATIONS – 2013**
**ESU3211 – EDUCATIONAL PSYCHOLOGY**
**DURATION – THREE (03) HOURS.**

Date: 04TH MARCH 2013 | Time: 9.30 a.m. 12.30 p.m.

**Answer all questions in Part I & three (03) questions from Part II.**

## PART I

01. Explain briefly 'what is educational Psychology'?

02. In relation to organizing learning experiences name three (03) aspects that should be considered by a teacher.

03. State two differences between the experimental method and non-experimental method which could be used to study the students behaviour.

04. Citing suitable examples explain the differences between 'growth' and 'development'.

05. Discuss the importance of the inter-relationship that exists between 'maturation' and 'learning'.

06. Describe three (03) principles of Vygotsky's theory of cognitive development.

07. Citing suitable examples, explain three (03) techniques that could be used to improve the students' memory.

08. Discuss three (03) similarities between the cognitive developmental theories of Piajet & Brurer.

(5 X 8 = 40 Marks)

## PART II

09. i. Explain the nature of the interdependence of hereditary and environmental factors influencing child development.

(06 marks)

ii. Citing suitable examples, discuss how the family and the school environmental conditions favourable and unfavourable to child's development. (for each give two (02) conditions)

(08 marks)

iii. As a teacher how would you help your students to overcome the above mentioned unfavourable environmental conditions.

(06 marks)

10. i. List out five (05) different behavioural characteristics of childhood and adolescence.

(05 marks)

ii. Explain five (05) problems faced by an individual during adolescence.

(07 marks)

iii. Discuss how a teacher could cooperate in solving above problems.

(08 marks)

11. i. Define the concept of 'motivation' in relation to learning.

(05 marks)

ii. Name three(03) approaches of motivation and explain the Key concepts put forward by two of them.

(10 marks)

iii. Discuss the role of the teachers in relation to generate motivation relevant to class room teaching-learning process.

(05 marks)

12. i. State three (03) categories of learning theories and mention one theory from each category.(03 theories)

(03 marks)

ii. Examine the basic principles of the above mentioned three (03) theories.

(09 marks)

iii. Select two (02) theories from the above question 12(ii) and discuss how the principles of the two theories could be used in the classroom situations.

(08 marks)

13. i. Explain personality by citing two definitions.

(05 marks)

ii. Explain three (03) factors that influence the development of personality.

(06 marks)

iii. Examine how the teachers could strive towards the development of student personality.

(09 marks)

14. Write short notes on any three (03) of the following themes.

i. Social development during adolescence.
ii. Major stages of development followed by developmental psychologists.
iii. Importance of the concept of 'readiness' to a teacher.
iv. Teachers role in discovery learning.

(6x3+2=20 marks)

*- Copyrights reserved -*